# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

# උපදේශක තනතුර - ඛනිජ තෙල් කර්මාන්තය

ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය සම්බන්ධයෙන් උපදෙස්දීම සහ සහාය වීම සඳහා ඛනිජතෙල් කර්මාන්තය නියාමනය සඳහා නම්කර ඇති ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සුදුසුකම් හා පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවයි.

ඛනිජ තෙල් කර්මාන්තය සඳහා නියාමන රාමුව ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය, නියාමන ධාරිතාවය ගොඩනැගීම සහ ඛනිජ තෙල් කර්මාන්තයට අදාළ ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සම්බන්ධීකරණය උපදේශකවරයාට පැවරෙන මූලික වගකීම වේ.

## සුදුසුකම් සහ පළපුරුද්ද

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත විශ්ව විද්‍යාලයකින් ලබාගත් රසායනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය.
- ඛනිජ තෙල් කර්මාන්තයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර ධුරයක වසර 10ක පළපුරුද්ද ඇතුළුව අවමය වසර 20ක තාක්ෂණික පළපුරුද්ද
- දේශීය හා විදේශීය ඛනිජ තෙල් වෙළඳපොළ පිළිබඳ පළපුරුද්ද හා අත්දැකීම්
- දේශීය හා ජාත්‍යන්තර උපදේශක පළපුරුද්ද
- නියාමන පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ
- පුහුණුකිරීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ

කොන්ත්‍රාත් කාලය වසරක් වන අතර සාර්ථක කාර්යසාධනය මත කොන්ත්‍රාත් කාලය දීර්ඝකිරීමට අවස්ථාව තිබේ. සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය මත තෝරාගැනීම කරනු ලැබේ.

අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, දුරකථන අංක, උපන් දිනය, වයස, පුරවැසිභාවය, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ වෙනත් තොරතුරු සහ අයදුම්කරු පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කළ හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක ඇතුළත් කරන ලද ජීව දත්ත තොරතුරු සහ අයදුම්පත 09/02/2020 වැනි දින හෝ එදිනට පෙර එවිය යුතු වේ. අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහළ කොටසේ හෝ ඊමේල් පණිවුඩයේ විෂය තීරයෙහි අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.


**සභාපති**

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**

**6 වන මහල, ලංකා බැංකු වෙළඳ කුලුන,**

**28, ශාන්ත මයිකල් පාර, කොළඹ - 03.**

**දුරකතනය: 011-2392608/7 ෆැක්ස්: 011-2392641**

**ඊමේල්:** careers@pucsl.gov.lk **වෙබ් අඩවිය:** www.pucsl.gov.lk


**2020-01-26**